සැ. යු.- 2017.03.10 දින පළ වූ අංක 2010 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,011 - 2017 මාර්තු මස 17 වැනි සිකුරාදා - 2017.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 504 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 508 |

*සැ. යු.* - (i) සමස්ත ලංකා ඓතිහාසික දේවාලවල පාරම්පරික නිලධාරීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 පෙබරවාරි මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත 2017 මාර්තු මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 අප්‍රේල් මස 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 මාර්තු මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පෙ-ාතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙ-වත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලා-වකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩද-ාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෙ-ාජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩි-කෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරී-මෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේ-වකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## වෙළෙඳ නාවික ලේකම් කාර්යාලය

වරාය හා නාවික අමාත්‍යාංශය

### පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

වරාය හා නාවික අමාත්‍යාංශයේ, වෙළෙඳ නාවික ලේකම් කාර්යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු නාමය | බඳවා ගන්නා ශ්‍රේණිය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (ඉංජිනේරු) | II ශ්‍රේණිය | 01 |
| සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (නැව් තට්ටු) | II ශ්‍රේණිය | 01 |

1. *සුදුසුකම් හා පළපුරුද්ද* :

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම්* | *පළපුරුද්ද* |
|---|---|---|---|
| සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (ඉංජිනේරු) | සමුද්‍රීය ඉංජිනේරු මුරකාවල කාර්යභාර නිලධාරි (සීමා රහිත) සහතිකය | අදාළ නොවේ | කිලෝවොට් 300ට වැඩි ධාරිතාවයක් ඇති සාගර තරණයෙහි යෙදෙන වෙළෙඳ නෞකාවක මුරකාවල කාර්යභාර ඉංජිනේරු නිලධාරියකු ලෙස වසර 02ක අවම පළපුරුද්ද |
| සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (නැව් තට්ටු) | ජලතරණ මුරකාවල කාර්යභාර නිලධාරි (සීමා රහිත) සහතිකය ලබා තිබීම | අදාළ නොවේ | දළ ටොන් 3000 ට වැඩි ධාරිතාවක් ඇති සාගර තරණයෙහි යෙදෙන වෙළෙඳ නෞකාවල මුරකාවල කාර්යභාර නැව් තට්ටු නිලධාරියකු ලෙස වසර 02ක අවම පළපුරුද්ද |

2. *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය. තෝරා ගන්නා අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

3. *වෙනත් සුදුසුකම්* :
   (i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
   (ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
   (iii) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට හෝ ඊට පෙර, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය. එසේ මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. *වයස් සීමාව* :

අවම සීමාව - අවුරුදු 21ට නොඅඩු
උපරිම සිමාව - අවුරුදු 45ට නොවැඩි
(දැනටමත් රාජ්‍ය සේවයේ සිටින නිලධාරින් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

5. *වැටුප් පරිමාණය* - රු. 34,605 - 10 x 660 - 11 x 755 - 15 x 930 - රු. 63,460

6. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කර, පහත දක්වා ඇති ලකුණු පටිපාටියට අනුව ලකුණු ලබා දෙනු ලැබේ.

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 |
| 02. වෘත්තීය සුදුසුකම් | 25 |
| 03. අතිරේක පළපුරුද්ද (බඳවා ගැනීමේදී සළකා බලනු ලබන පළපුරුද්දට අමතරව) | 20 |
| 04. ඉංග්‍රීසි භාෂා කුසලතාවය | 10 |
| 05. පරිගණක සාක්ෂරතාව | 10 |
| 06. සම්මුඛ පරීක්ෂණයේදී | 05 |
| | **100** |

(i) මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප්, වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතු ය.

7. *ඉල්ලුම් කළ යුතු ආකාරය* :

(i) මෙම ගැසට් නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම්පත් ලියාපදිංචි තැපෑලෙන් 2017 අප්‍රේල් මස 20 වැනි දින හෝ ඊට පෙර වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ නාවික ලේකම් කාර්යාලය, පළමු මහල, බ්‍රිස්ටල් ගොඩනැගිල්ල, අංක 43-89, යෝක් වීදිය, කොළඹ 01. යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදළ තනතුර සඳහන් කළ යුතු ය.

(ii) රාජ්‍ය සේවයේ යෙදී සිටින නිලධාරීන් සිය අයදුම්පත් අදළ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

2017 මාර්තු මස 17 වැනි දින,
''වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්''
වෙළඳ නාවික ලේකම් කාර්යාලය,
වරාය හා නාවික අමාත්‍යාංශය,
පළමු මහල, බ්‍රිස්ටල් ගොඩනැගිල්ල,
43-89, යෝක් වීදිය,
කොළඹ 01.

***වෙළඳ නාවික ලේකම් කාර්යාලය***

*සහකාර රාජ්‍ය නෞකා සමීක්ෂක (ඉංජිනේරු)/(නැව් තට්ටු)*
*තනතුර සඳහා අයදුම් පත්‍රය*

01. අයදුම්කරුගේ නම :
   (i) මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :————.
   (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
   (ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
   (iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. ලිපිනය හා දුරකථන අංකය ෑ
(i) කාර්යාලීය ලිපිනය :————.
දුරකථන අංකය :————.
(ii) පෞද්ගලික ලිපිනය :————.
දුරකථන අංකය :————.
ජංගම දුරකථන අංකය :————.

03. උපන් දිනය ෑ
අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ෑ

අවුරුදු :————.මාස :————. දින :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

07. විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :————.

08. අධ්‍යාපන සුදුසුකම් ෑ

| සුදුසුකම | සුදුසුකම් ලබාගත් වර්ෂය | විෂය ධාරාව | සාමාර්ථය | ආයතනයේ නම | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | | | |

09. වෘත්තීය සුදුසුකම් ෑ

| සුදුසුකම | සුදුසුකම ලබාගත් වර්ෂය | විෂය ධාරාව | සාමාර්ථය | ආයතනයේ නම |
|---|---|---|---|---|
| | | | | |

10. පළපුරුද්ද පිළිබඳ විස්තර ෑ

| සේවය කළ ආයතනය | තනතුර | එම තනතුරට අදළ කාර්යයන් සැකෙවින් | සේවා කාලය |
|---|---|---|---|
| | | | |

11. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ ලබා ඇති ප්‍රවීණතාව ෑ
(i) උපාධිය :————.
(ii) ඩිප්ලෝමාව :————.
(iii) සහතික පත්‍ර පාඨමාලාව :————.

12. ඉංග්‍රීසි භාෂා කුසලතාවය ෑ
(i) උපාධිය :————.

(ii) ඩිප්ලෝමාව :————.
(iii) සහතික පත්‍ර පාඨමාලාව :————.

13. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේ ද ? :————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. එසේම මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් වැරදි හෝ අසත්‍ය ඒවා බවට, බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අපේක්ෂකත්වය අවලංගු වන බවට හා බඳවා ගත් පසු අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියාමාර්ගයන්ට යටත් වීමට සිදුවන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම* :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .....................මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ඇය ........... වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

15. *දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය* :
(දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහා පමණක් අදළ වේ.)

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන ........................ මයා/මිය/මෙනවිය දනට ................. තනතුරේ සේවය කරන බවත් ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදයක වන බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බව හා එසේ කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

03-831

---

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ සභාපති තනතුර

01. පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ සභාපති තනතුර සඳහා අයදුම්පත් කැඳවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත. සියලු අයදුම්පත් 2017.04.17 දින හෝ ඊට පෙර මෙම කාර්යාලය වෙත ලැබිය යුතු ය.

02. *සුදුසුකම්* :
නීතිඥ වෘත්තියේ අවුරුදු 10කට වැඩි පළපුරුද්දක්.

03. සභාපතිවරයකුහට ගෙවනු ලබන දීමනා පහත පරිදි වේ :
මාසික දීමනාව - රු. 65,000
ඉන්ධන දීමනාව - රු. 26,325 (මාසිකව)

ජේ. එම්. ඩබ්. පී. ජයතිලක,
*වැඩබලන ලේකම්,*
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2017 මාර්තු මස 01 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
කොළඹ 12.

03-612

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### විදේශ කටයුතු අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා විදේශ සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016 (2017)

ශ්‍රී ලංකා විදේශ සේවයේ III ශ්‍රේණියේ (මෙහි මින් ඉදිරියට 'සේවය' යනුවෙන් සඳහන් වන) පවතින පුරප්පාඩු 25ක් පිරවීම සඳහා අංක 02 හි සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*
නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට හා යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව, ලිඛිත විභාගයේ දී හා සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් මුළු ලකුණුවල එකතුව මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සුදුසු අයදුම්කරුවන් බඳවාගනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම් :*

(i) අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම්:

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින්

  හෝ

- උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින්

  හෝ

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශ විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක් ලබා තිබීම. (මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ලිඛිත සාක්ෂි සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතුවේ.)

(ii) කායික සුදුසුකම්:
සෑම අපේක්ෂකයකුම මෙරට හෝ ලෝකයේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(iii) වෙනත් :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය. (ද්විත්ව පුරවැසිභාවය ඇති පුද්ගලයකු ශ්‍රී ලංකා විදේශ සේවයට පත් වුවහොත් ඔහු/ඇය සිය විදේශ පුරවැසිභාවය අවලංගු කරවා ගතයුතු අතර සිය සේවා කාලය තුළ වෙනත් රටක පුරවැසිභාවය ලබා නොගත යුතු ය.)

(ආ) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

(ඇ) අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට මෙම තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

*සටහන :*

(i) කුමන හෝ ආගමක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට ශ්‍රී ලංකා විදේශ සේවයට තෝරාගැනීමේ විභාගයට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට අවසර නැත.

(ii) එක් අයදුම්කරුවකුට උපරිම වශයෙන් අවස්ථා තුනක් පමණක් විවෘත තරග විභාගයට පෙනී සිටිය හැකිය.

(iii) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කර ඇති දිනයට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

(i) මෙම සේවය සඳහා තෝරා ගනු ලබන අයදුම්කරුවන්, රාජ්‍ය සේවයේ පත්වීම් කෙරෙහි බලපාන පොදු කොන්දේසි මත, වසර 2016.12.06 දින ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථා මාලාවට මෙතෙක් කර ඇත්තා වූ හෝ මින් ඉදිරියට කරනු ලබන්නා වූ හෝ සංශෝධන කිසිවක් වෙතොත් ඒවා ද සමග එකී ව්‍යවස්ථා මාලාවේ දක්වා ඇති වගන්ති හා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(ii) මෙම තනතුර ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු වේ.

(iii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය. විදේශ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත සේවාවට බැඳුනු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබාගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යකින් සේවයට බැඳුනු නිලධාරින් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතු ය.

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත්වේ.

(vi) කිසියම් අපේක්ෂකයකු සේවයට බඳවා ගැනීමෙන් පසුව වුව ද මෙම නිවේදනයේ හෝ ශ්‍රී ලංකා විදේශ සේවයේ ව්‍යවස්ථාවේ සඳහන් කිසියම් සුදුසුකමක් හෝ කොන්දේසියක් සපුරා නොමැති බවට හෝ සාවද්‍ය තොරතුරු සපයා ඇති බව තහවුරු වුවහොත් ඔහුගේ හෝ ඇයගේ සේවය අහෝසි කිරීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

04. *වයස් සීමාව* :

අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 22 ට එළඹ සිටිය යුතු අතර අවුරුදු 30 ට නොඑළඹ සිටිය යුතු ය. (ඒ අනුව 1995.04.17 දිනට හෝ ඊට පෙර හා 1987.04.17 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

රාජ්‍ය සේවයේ නිරත අයදුම්කරුවකු නම්, ඔහු/ඇය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 35 ට නොඑළඹ සිටිය යුතු අතර, (ඒ අනුව 1982.04.17 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අය පමණක්) සතුටුදායක සේවා වාර්තාවක් ද ලබා සිටිය යුතු ය.

*සටහන* :

(i) ඉහත 04 ඡේදයේ ප්‍රකාශිත අරමුණ වෙනුවෙන් රාජ්‍ය සේවයේ නිරත අයදුම්කරුවකු යනු (ආයතන සංග්‍රහයේ 1 වැනි පරිච්ඡේදයේ නිර්වචනය කර ඇති පරිදි) අයදුම්පත් භාරගැනීම අවසන් කරන දිනට සේවයේ ස්ථිර කරන ලද රාජ්‍ය සේවයේ නිලධාරියකු හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියකු වේ.

(ii) අයදුම්පත් භාරගැනීම අවසන් කරන දිනට පූර්වාසන්න වූ පස් අවුරුදු කාලය තුළ දී හෝ සේවයේ යෙදී සිටි කාලසීමාව ඊට අඩු නම් එම මුළු කාලසීමාවේ දී හෝ සතුටුදායක සේවා වාර්තාවක් ලබා තිබුණි නම් මිස නැත්නම් දැනට රාජ්‍ය සේවයේ නියුතු කිසිදු නිලධාරියකු මෙම විභාගයට පෙනී සිටීම සඳහා යෝග්‍ය නොවනු ඇත.

(iii) රාජ්‍ය සේවයේ නිලධාරියකු, සතුටුදායක සේවා වාර්තා ලබා ඇති සේ සලකනු ලබන්නේ ඔහු/ඇය අයදුම්පත් භාර ගැනීම අවසාන කරන දිනට පෙරාතුව පස් අවුරුදු කාලසීමාව තුළ හෝ තත් ආයතනයේ මුළු සේවා කාලය ඊට අඩු නම් එම මුළු සේවා කාලය තුළ හෝ යෙදුණු සියලු වැටුප් වර්ධක ද උපයාගෙන, එකී කාලසීමාව තුළ කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් (අවවාද කිරීමක් හැර) කිසිදු අන්දමක දඬුවමක් නොලැබ සිටියේ නම් පමණකි.

(iv) රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් තම අයදුම්පත් එවිය යුත්තේ තම තමන්ගේ අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මගිනි.

05. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට අදාළව 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය පහත පරිදි වේ.

රු. 47,615 - 10x1,335 - 8x1,630 - 17x2,170 - රු. 110,895 ( SL -1-2016) - මාසික

එසේ වුව ද වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි ය.

06. ලිඛිත පරීක්ෂණය ඃ

(I) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් 2017 ජුනි මස කොළඹ දී පවත්වනු ලැබේ.

(II) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ.

(III) අයදුම්කරුවකුට ඉහත දක්වා ඇති භාෂාවලින් එකකින් විභාගයට පෙනී සිටිය හැක. එසේ වුව ද ඔහු/ඇය තමන් තෝරා ගත් එක් භාෂාවකින් පමණක් සියළුම විෂයන්ට පෙනී සිටිය යුතු ය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(IV) ලිඛිත විභාගය පහත සඳහන් විෂයන් පිළිබඳ ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ. :-

| විෂය අංකය | විෂයය | නියමිත කාලය | ලකුණු | අවම ලකුණු |
|---|---|---|---|---|
| 01. | පොදු ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 | 40 |
| 02. | ලෝක තතු I | පැය 03 | 100 | 40 |
| 03. | ලෝක තතු II | පැය 03 | 100 | 40 |
| 04. | රචනය | පැය 03 | 100 | 40 |
| 05. | සාරාංශය | විනාඩි 30 | 50 | 25 |
| 06. | බහුවරණ ප්‍රශ්න පත්‍රය<br>■ බුද්ධි පරීක්ෂණය<br>■ සාමාන්‍ය දැනීම සහ තත්කාලීන සිදුවීම් | පැය 02 විනාඩි 30 | 150 | 75 |
| 07. | භාෂා ප්‍රවීණතාවය | පැය 03 | 100 | 40 |

(V) ලිඛිත පරීක්ෂණය පවත්වන බලධාරියා : විභාග කොමසාරිස් ජනරාල්

(VI) වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

(VII) යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණය : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු පරිපාටියකට අනුව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

සටහන ඃ

(i) ලිඛිත විභාගයේ ප්‍රශ්න පත්‍ර හතටම (07) පෙනී සිට, එක් එක් විෂයය සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය හා 350 කට නොඅඩු අවම මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගන්නා අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් පස්ගුණයකට නොවැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් පමණක් යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත පරීක්ෂණ මණ්ඩලයක් විසින් යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

(iii) ලිඛිත පරීක්ෂණයේ ලකුණු යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලබාදෙනු නොලැබේ.

(iv) ලිඛිත පරීක්ෂණයේ මුළු ලකුණු ප්‍රමාණයට යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා මුළු ලකුණු ප්‍රමාණය එකතුකර කුසලතා අනුපිළිවෙල සකස් කරනු ලැබේ. කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තනතුරකට බඳවාගනු ලැබේ.

(VIII) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබාදෙනු නොලැබේ.

ඉටුකරගැනීමට අපේක්ෂිත අරමුණු : ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

(IX) අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ පළකිරීම, ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කිරීම මගින්.

(X) ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය :

(අ) පොදු ප්‍රශ්න පත්‍රය :
ශ්‍රී ලංකාවේ දේශපාලන, සාමාජයීය, සංස්කෘතික හා ආර්ථික පරිසරය පිළිබඳවත්, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත්වන වත්මන් කරුණු පිළිබඳව සහ තාක්ෂණික හා විද්‍යාත්මක සංවර්ධනය පිළිබඳවත් අයදුම්කරු ලබා ඇති දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ.

(ආ) ලෝක තතු I :
සමස්ත ලෝකයේ සාමය, ආරක්ෂාව හා සංවර්ධනය පිළිබඳ ප්‍රවණතා සහ ඒවා ශ්‍රී ලංකාව කෙරෙහි බලපාන ආකාරය විග්‍රහ කිරීමෙහිලා අයදුම්කරු සතු හැකියාව නිශ්චය කිරීම සඳහා ලෝකයේ දේශපාලන සිදුවීම්, එක්සත් ජාතීන්ගේ සංවිධාන හා වෙනත් ජාත්‍යන්තර සංවිධාන හා ගැටුම් තත්වයන් හා නොයෙකුත් ජාතික හා ජාත්‍යන්තර ව්‍යාපාරවල දියුණුව අළලා වූ ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ.

(ඇ) ලෝක තතු II :
ජාත්‍යන්තර සංවිධානවල කාර්යභාරය, කලාපීය ආර්ථික කණ්ඩායම්වල බලපෑම, පරිසරය හා ධරණීය සංවර්ධනය වැනි ප්‍රශ්න ද ඇතුළත්ව වෙළෙඳාම හා ආර්ථික සංවර්ධනය පිළිබඳ මෑත කාලීන ප්‍රවණතා හා ඒවා ශ්‍රී ලංකාවට අදාළ වන ආකාරය පිළිබඳ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු වේ.

(ඈ) රචනය

නියමිත විෂයක් හෝ කිහිපයක් හෝ යටතේ රචනා ලිවිය යුතුය. මෙම මාතෘකා අධ්‍යයන ක්ෂේත්‍රයේ කිසිම විෂයකට සම්බන්ධ නොවන අතර, එය සකස් කරනු ලබන්නේ අපේක්ෂකයා/ අපේක්ෂිකාවගේ සාමාන්‍ය දැනීම සහ බුද්ධියත්, සිතීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාවත් පරීක්ෂා කිරීම පිණිසය. මාතෘකාව යටතේ කරුණු දැක්වීමෙහිලා අයදුම්කරුගේ කල්පනා ශක්තිය හා ප්‍රතිභාව මෙන්ම භාෂා ශෛලිය හා ඉදිරිපත් කිරීමේ හැකියාව නිශ්චය කිරීම සඳහා රචනය උපයෝගී කර ගනු ලැබේ. එය කියවිය හැකි පරිදි පැහැදිලි අකුරෙන් ලිවිය යුතුය.

**සටහන :** කරුණට අදාළවන පරිදි පැහැදිලිව ලිවීමේ වැදගත්කම කෙරෙහි අපේක්ෂක/ අපේක්ෂිකාවන්ගේ අවධානය යොමු කරනු ලැබේ. විෂයය මනා පරීක්ෂණයකට භාජනය කිරීම, විමසා බැලීමේ ශක්තිය, ලිවීමේ තත්ත්වය, තම අදහස් කෙටියෙන් පැහැදිලිව ප්‍රකාශ කිරීමේ ශක්තිය සඳහා ලකුණු හිමි වේ.

(ඉ) සාරාංශ :
දී ඇති ඡේදයක / ඡේදයන්හි අර්ථය අවබෝධ කරගෙන එය සිත් ඇදගන්නා ආකාරයෙන් පැහැදිලිව හා සංක්ෂිප්තව ඉදිරිපත් කිරීමෙහිලා අයදුම්කරුගේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කොට ඇත.

(ඊ) බහුවරණ ප්‍රශ්න පත්‍රය :
මෙම ප්‍රශ්න පත්‍රය, එක් කොටසකට ලකුණු 75ක් ලැබෙන ප්‍රශ්න 50 ක් බැගින් වූ පහත දැක්වෙන පරිදි වූ කොටස් දෙකකින් සමන්විත වනු ඇත.

- බුද්ධි පරීක්ෂණය : මෙම කොටසින් අයදුම්කරුවන්ගේ තාර්කික හැකියාව සහ විශ්ලේෂණාත්මක කුසලතාව මැන බැලෙනු ඇත. (කාලයඃ මිනිත්තු - 75)
- සාමාන්‍ය දැනීම හා තත්කාලීන සිදුවීම් : දේශීය හා ජාත්‍යන්තර වශයෙන් දේශපාලන, ආර්ථික සහ සමාජයීය - සංස්කෘතික ක්ෂේත්‍ර වල සිදුවන වෙනස්කම් පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම මෙම කොටසින් මැන බැලෙනු ඇත. (කාලයඃ මිනිත්තු - 75)

(උ) භාෂා ප්‍රවීනතා ප්‍රශ්න පත්‍රය
භාෂා ප්‍රවීනතාව පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ.

(සිංහල, දෙමළ හා ඉංග්‍රීසි ලෙස ප්‍රශ්න පත්‍ර 03 ක් වන අතර මුළු ලකුණු ප්‍රමාණය 100 වේ. කාලය පැය 03 කි).

සිංහල මාධ්‍යයෙන් හා දෙමළ මාධ්‍යයෙන් පෙනී සිටින අපේක්ෂකයන් ඉංග්‍රීසි භාෂාව ප්‍රශ්න පත්‍රයකට ද, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිටින අපේක්ෂකයන් සිංහල හෝ දෙමළ භාෂා ප්‍රශ්න පත්‍රයකට ද පෙනී සිටිය යුතුය.

07. යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණය

(i) යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ ලිඛිත විභාගයේ ප්‍රශ්න පත්‍ර හතටම (07) පෙනී සිට එක් එක් විෂයය සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් සහ ලේකම්වරයා විසින් නියම කරනු ලබන, 350 කට නොඅඩු මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගන්නා වූ අයදුම්කරුවන් පමණි. එතකුදු වුවත් එසේ කැඳවනු ලබන සංඛ්‍යාව පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් පස් ගුණයකට නොවැඩි විය යුතුය.

(ii) යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු 100 ක් හිමි වේ.

(iii) කිසිම හේතුවක් නිසාවත් අවම ලකුණු සංඛ්‍යාව අඩු කරනු නොලැබේ.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අපේක්ෂක අපේක්ෂිකාවන් සම්බන්ධයෙන් යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ඇත. අපේක්ෂකයා/ අපේක්ෂිකාව බඳවා ගනු ලබන සේවයට ඔහුගේ/ ඇයගේ යෝග්‍යතාව මැන බැලීම යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයේ අරමුණ වේ. යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය තම නිගමනයට එළඹීමේදී අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ බුද්ධිය සහ මානසික උත්සුකතාව කෙරෙහිත්, පෞරුෂත්වය කෙරෙහිත් විශේෂයෙන් සැලකිල්ලක් දක්වනු ලැබේ. අයදුම්කරුගේ අනෙකුත් භාෂා ප්‍රවීනතාවන්, උසස් අධ්‍යාපන සුදුසුකම් හා පරිගණක හැකියාව මෙම යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ඇගයීමට ලක් කරනු ඇත.

(v) ලිඛිත විභාගයේ දී අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණු යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට දැනගැනීමට සලස්වනු නොලැබේ.

(vi) අයදුම්කරුවන් තක්සේරු කිරීම සඳහා වූ යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් විමසා සැළසුම් කර පැවැත්වෙනු ඇත.

(vii) යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයයේදී ලකුණු ලබාදෙන ආකාරය පහත පරිදි වේ. :

| යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ | | කල්පිත ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01. | **අතිරේක අධ්‍යාපනික සුදුසුකම්** | | 20 |
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක් විසින් ලබාදෙන | | |
| | විශේෂ උපාධිය | | |
| | (i) පළමු පන්තියේ සමාර්ථයක් සහිත උපාධියක් | 20 | |
| | (ii) දෙවන පන්තියේ ඉහළ සමාර්ථයක් සහිත උපාධියක් | 18 | |
| | (iii) දෙවන පන්තියේ පහළ සමාර්ථයක් සහිත උපාධියක් | 16 | |
| | සාමාන්‍ය උපාධිය | | |
| | (i) පළමු පන්තියේ සමාර්ථයක් සහිත උපාධියක් | 18 | |
| | (ii) දෙවන පන්තියේ ඉහළ සමාර්ථයක් සහිත උපාධියක් | 16 | |
| | (iii) දෙවන පන්තියේ පහළ සමාර්ථයක් සහිත උපාධියක් | 14 | |

| | යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ | කල්පිත ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 02. | **වෘත්තීය සුදුසුකම්** | | 15 |
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක් විසින් ලබාදෙන - | | |
| | (i) පශ්චාත් උපාධියක් සඳහා | 15 | |
| | (ii) පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසරකට නොඅඩු) | 13 | |
| | (iii) ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (මාස 06 කට නොඅඩු) | 10 | |
| | (iv) ඩිප්ලෝමා / සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (මාස 03 කට නොඅඩු) | 08 | |
| 03. | **ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීනතාව** | | 15 |
| | (i) ඉංග්‍රීසි විශේෂවේදී උපාධියක් | 15 | |
| | (ii) ඉංග්‍රීසි භාෂාව උපාධියේ ප්‍රධාන විෂයයක් ලෙස (සාමාන්‍ය කලා උපාධිය යටතේ) | 08 | |
| | (iii) ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබාගත් උපාධියක් | 07 | |
| | (iv) පිළිගත් විශ්වවිද්‍යාලයකින්, කාර්මික විද්‍යාලයකින් හෝ රජයේ ලියාපදිංචි අධ්‍යාපන ආයතනයකින් ලබාගත් ඩිප්ලෝමා පාඨමාලාවක් (කාල සීමාව වසරකට වඩා වැඩි විය යුතුය.) හෝ TOEFL, (TOEFL-iBT Score 79, TOFEL-CBT Score 213, TOEFL-PBT, (Score 550 or above) හෝ IELTS (Score 6.0 or above) වැනි සුදුසුකම හෝ ඒ හා සමාන සුදුසුකමක් | 07 | |
| | (v) ඉංග්‍රීසි භාෂාව අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රධාන විෂයයක් ලෙස (දේශීය හෝ ලන්ඩන් විෂය නිර්දේශවලට අනුව) | | |
| | විශිෂ්ට සාමාර්ථය | 05 | |
| | අධිසම්මාන සාමාර්ථය | 04 | |
| | සම්මාන සාමාර්ථය | 03 | |
| | සාමාන්‍ය සාමාර්ථය | 02 | |
| 04. | **විදේශ භාෂා ප්‍රවීනතාව** | | 10 |
| | අරාබි, චීන (මැන්ඩරින්), ප්‍රංශ, ජර්මන්, හින්දි, ඉතාලි, ජපන්, කොරියානු, රුසියානු හා ස්පාඤ්ඤ යන භාෂා | | |
| | (i) විෂයයක් ලෙස හදාරා ඇති උපාධියක් සඳහා | 10 | |
| | (ii) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ | | |
| | විශිෂ්ඨ සාමාර්ථය | 09 | |
| | අධිසම්මාන සාමාර්ථය | 08 | |
| | සම්මාන සාමාර්ථය | 07 | |
| | සාමාන්‍ය සාමාර්ථය | 06 | |
| | (iii) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ | | |
| | විශිෂ්ඨ සාමාර්ථය | 05 | |
| | අධිසම්මාන සාමාර්ථය | 04 | |
| | සම්මාන සාමාර්ථය | 03 | |
| | සාමාන්‍ය සාමාර්ථය | 02 | |
| | (iv) ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (මාස 06 කට නොඅඩු) | 05 | |
| | (v) සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (මාස 03 කට නොඅඩු) | 03 | |

| යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ | | කල්පිත ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 05. | **පරිගණක ප්‍රවීණතාව** | | 05 |
| | (i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් | 05 | |
| | (ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින්, කාර්මික විද්‍යාලයකින් හෝ රජයේ ලියාපදිංචි අධ්‍යාපන ආයතනයකින් ලබාගත් ඩිප්ලෝමා පාඨමාලාවක් (අවුරුද්දකට නොඅඩු) | 03 | |
| | (iii) රජයේ ලියාපදිංචි අධ්‍යාපන ආයතනයකින් ලබාගත් සහතික පත්‍ර පාඨමාලාවක් (මාස 06 කට නොඅඩු/පැය 720 කට නොඅඩු) | 02 | |
| | (තොරතුරු තාක්ෂණ උපාධිය මූලික සුදුසුකම වන්නේ නම්, මෙම ශීර්ෂය යටතේ තොරතුරු තාක්ෂණ උපාධියට ලකුණු ලබාදෙනු නොලැබේ.) | | |
| 06. | **රාජ්‍ය භාෂා ප්‍රවීණතාව (විභාගයට පෙනී සිටින භාෂාව හැර)** | | 10 |
| | (i) අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ පළමු භාෂාව ලෙස | | |
| | විශිෂ්ඨ සාමාර්ථය | 06 | |
| | අධිසම්මාන සාමාර්ථය | 04 | |
| | සම්මාන සාමාර්ථය | 03 | |
| | සාමාන්‍ය සාමාර්ථය | 02 | |
| | (ii) අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ දෙවන භාෂාව ලෙස | | |
| | විශිෂ්ඨ සාමාර්ථය | 04 | |
| | අධිසම්මාන සාමාර්ථය | 03 | |
| | සම්මාන සාමාර්ථය | 02 | |
| | සාමාන්‍ය සාමාර්ථය | 01 | |
| 07. | **පෞරුෂත්වය, සන්නිවේදන කුසලතා සහ විශේෂ කුසලතා** | | 25 |
| | පෞරුෂත්වය | 10 | |
| | සන්නිවේදන කුසලතා | 10 | |
| | විශේෂ කුසලතා | 05 | |
| | **එකතුව** | | 100 |

08. අයදුම් කරන ආකාරය ඃ

(i) අයදුම්පත්‍ර, ආදර්ශ ආකෘතියට අනුව A4 පත්‍රයක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. A4 පත්‍රයේ දෙපසම පාවිච්චි කළ යුතු අතර, අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 දක්වා පළමු පිටුවට ද, ඉතිරිය දෙවන හා තෙවන පිටුවලට ද ඇතුළත් වන සේ අයදුම්පත සකස් කළ යුතුය. අයදුම්පත අපේක්ෂකයාගේ අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අයදුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ තොරතුරු සඳහන් අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඔබ විසින් ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) අපේක්ෂකයා/ අපේක්ෂිකාව විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත පිළියෙළ විය යුතුය.

(iii) සම්පූර්ණ කරන ලද අයදුම්පත ''විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ'' යන ලිපිනයට 2017 අප්‍රේල් මස 17 වන දා හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''ශ්‍රී ලංකා විදේශ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016 (2017) යනුවෙන් පැහැදිලිව සලකුණු කර තිබිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ (සෙ.මී. 2 x සෙ.මී. 2) ප්‍රමාණයේ කොටුවක් තුළ ඉංග්‍රීසි 'S' අක්ෂරය සඳහන් කළ යුතුය.

(iv) සෑම අතින්ම සම්පූර්ණ නොවූ අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත. තැපෑලේදී යම් අයදුම්පතක් නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ ඉදිරිපත් කෙරෙන පැමිණිලි සළකා බලනු නොලැබේ.

(v) අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(vi) අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට හෝ තනතුර සඳහා සුදුසු යැයි පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

09. විභාගයට ප්‍රවේශය :

(i) අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රු. 240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය. විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු අත්සන සහතික කරවාගත් තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයකුට/ අපේක්ෂිකාවකට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(ii) අයදුම්කරුවකු විභාගයට පෙනී සිටිය යුත්තේ ඔහුට/ ඇයට නියම කරන ලද විභාග ශාලාවේදීය. සෑම අපේක්ෂකයෙකු/ අපේක්ෂිකාවකම විභාගයට පෙනී සිටින පළමු දිනයේදී ම විභාගයට පෙනී සිටීමට පෙර, තම ප්‍රවේශ පත්‍රය, විභාග ශාලාධිපතිට භාර දිය යුතුය. සියලුම අයදුම්කරුවන් විසින් පිළිපැදිය යුතු නීති මාලාවක් මේ *ගැසට්* පත්‍රයේ පළ වේ.

10. විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 1,200/= ක් වන අතර අයදුම්පත් භාර ගැනීම අවසන් කරන දිනයට පෙර මෙම ගාස්තුව ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වනු පිණිස තැපැල් / උප තැපැල් කාර්යාලයකට ගෙවිය යුතු වේ. අදාළ කුවිතාන්සියේ ඡායා පිටපතක් අයදුම්කරු විසින් තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර නොගන්නා බවද සැලකිය යුතුය.

***සටහන***

කවර හේතුවක් නිසා වුව ද විභාගයෙන් ඉවත් වන හෝ, නොපැමිණ සිටින හෝ, විභාගයට පෙනී සිටීමෙන් පසු සුදුසුකම් නැත්තෙකු බවට දක්නට ලැබෙන හෝ යම් අපේක්ෂකයෙකුට විභාග ගාස්තුව මුළුමනින්ම හෝ ඉන් කොටසක් හෝ ආපසු ලබා ගැනීමට හෝ වෙනත් විභාගයකට මාරු කිරීමට හිමිකමක් නැත.

11. *අයදුම්කරුගේ අනන්‍යතාව* :

අයදුම්කරු තමන් පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ඔහුගේ/ ඇයගේ අනන්‍යතාව ඔප්පු කළ යුතු වේ. මේ සඳහා මතු සඳහන් ලියවිලිවලින් කවරක් හෝ පිළිගනු ලැබේ. :

(I) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ;

(II) වලංගු විදේශ ගමන් බලපත්‍රය

12. ප්‍රතිඵල නිකුත් කිරීම :

මෙම නිවේදනයේ 06 ඡේදයට අනුව උපරිම සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් යෝග්‍යතා ඇගයීම් පරීක්ෂණයට යොමු කිරීමෙන් අනතුරුව එම පරීක්ෂණ දෙකෙන්ම ලබාගන්නා මුළු ලකුණු කුසලතාවය අනුව සකස්කළ ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිසම වෙත ලබාදෙනු ඇත. අනතුරුව විභාගයට පෙනීසිටි සියළුම අයදුම්කරුවන් වෙත රාජ්‍ය සේවා කොමිසමේ නියමය පරිදි ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම සිදුකරනු ඇත.

13. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

14. මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි වන්නේය. එමෙන්ම පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

15. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඇසල වීරකෝන්,
ලේකම්,
විදේශ කටයුතු අමාත්‍යාංශය,

2017 මාර්තු මස 03 වැනි දින
විදේශ කටයුතු අමාත්‍යාංශය
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 01.

***ආදර්ශ අයදුම්පත්‍රය***

*රාජ්‍ය සේවා කොමිෂන් සභාව*

**විදේශ කටයුතු අමාත්‍යාංශය**

***ශ්‍රී ලංකා විදේශ සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2016 (2017)***

Open Competitive Examination for Recruitment to Grade III of the Sri Lanka Foreign Service - 2016 (2017)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

☐

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

☐

01.(i) (*අ*) මුල්'කුරු අගට යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි) කැපිටල් අකුරෙන් : *උදා* : (SUMANASIRI E.D.C.B.A.) :————.

(*ආ*) මුල්'කුරු අගට යොදා මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

(ii) (*අ*) මුල'කුරුවලින් කියවෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(*ආ*) මුල'කුරුවලින් කියවෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. ලිපිනය ඃ

(i) පදිංචි ස්ථානය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(විභාග ප්‍රවේශ පත්‍රය තැපැල් කරනු ලබන්නේ මෙම ලිපිනයටය)
(ii) කාර්යාලයීය :————.
(iii) දුරකථන අංකය ඃ කාර්යාලයීය :————.
පෞද්ගලික :————.

03. ස්ත්‍රී/පුරුෂභාවය ඃ

පුරුෂ - 0
ස්ත්‍රී - 1 ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐

05. *ගැසට්* නිවේදනයේ අංක 6.X. (*උ*) පරිදි 'භාෂා ප්‍රවීණතාවය' විෂයය සඳහා ඉල්ලුම් කරන භාෂාව ඃ

(සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4) අදාළ අංකය කොටුව තුළ ලියන්න ☐

06. (i) උපන් දිනය ඃ-

අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ii) අයදුම්පතක් භාරගන්නා අවසාන දිනට වයස ඃ

අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

07. ජනවර්ගය ඃ ☐

(අදාළ අංකය කොටුව තුළ යොදන්න)

(සිංහල- 1, දෙමළ - 2, ඉන්දියානු දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)

08. සිවිල් තත්වය ඃ
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
අවිවාහක - 1 ☐
විවාහක - 2

09. ශ්‍රී ලංකා විදේශ සේවයට පත්වීම සඳහා මීට පෙර යම් විභාගයකට පෙනී සිට ඇත්නම් අවුරුද්ද/අවුරුදු සඳහන් කරන්න.

(*අ*) ............................................
(*ආ*) ............................................
(*ඇ*) ............................................

10. ඔබ රාජ්‍ය සේවයේ යම් තනතුරක් දරන උපාධිධාරියෙක් නම් එම තනතුරේ නම සඳහන් කරන්න. :————.

11. උපාධිය පිළිබඳ විස්තර සහ එය පිරිනැමූ දිනය : (මෙහිලා සුදුසුකම් තිබේදැයි දැනගනු පිණිස මේ දැන්වීමේ 2 (i) ඡේදය කියවා බලන්න.)

(i) විශ්වවිද්‍යාලය / ආයතනය :————.
(ii) උපාධියේ නම:————.
(iii) උපාධිය පිරිනැමූ දිනය :————.
(iv) සාමාන්‍ය / විශේෂ :————.
(v) විෂය :————.
(vi) පන්තිය :————.

12. අදාළ වන වෙනත් අධ්‍යාපනික /වෘත්තීය සුදුසුකම් ඇත්නම් (පශ්චාත් උපාධි/ඩිප්ලෝමා/විදේශ භාෂා ප්‍රවීණතාව ආදිය) සඳහන් කරන්න. :

..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................

13. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
(i) විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැක) |
|---|

14. අයදුම්කරුගේ සහතිකය :

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු කිරීමටත්, පත්කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් මා සේවයෙන් පහකිරීමට හැකි බවත් මම දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු / ඇය මා ඉදිරිපිට දී .............................. දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

16. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

(දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ / නියුතු අපේක්ෂකයකු / අපේක්ෂිකාවක් නම් පමණි.)

.............................. මහතා/ මෙනවිය/මිය ........................... දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලසීමාව තුළ (අ) තමාට හිමි සියලු වැටුප් වර්ධක උපයා ඇති බවත්, (ආ) අවවාද කිරීමක් හැර කිසිදු විනය දඬුවමකට ලක්වී නැති බවත් සොයා බලා සැකහැර දැනගතිමි.

මෙම අයදුම්පතේ සපයා ඇති තොරතුරු නිවැරදි බව ද නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

මෙම නිලධාරියා/නිලධාරිණිය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් වහාම මුදාහළ හැකි වේ.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන සහ පදවිය.

දිනය :————.

03-893

---

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ අධීක්ෂණ කළමනාකරු (සංඥා හා විදුලි සංදේශ) III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීම (බාහිර) - 2017

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ අධීක්ෂණ කළමනාකරු (සංඥා හා විදුලි සංදේශ) - III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා 2017.04.17 වැනි දිනට වයස අවුරුදු 18ට වැඩි සහ 30ට නොවැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

02. අයැදුම්පත් භාරගන්නා අවසාන දිනය 2017.04.17 වේ. සියලුම අයැදුම්පත් එදිනට ප්‍රථම ප්‍රධාන ඉංජිනේරු (සංඥා හා විදුලි සංදේශ), සංඥා හා විදුලි සංදේශ උප දෙපාර්තමේන්තුව, අංක 417, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කිසිම අයැදුම්පතක් පුද්ගලික නමට එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ නොකළ යුතුය. අසම්පූර්ණ, අවිධිමත්, අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, නිසි පරිදි මුදල් ගෙවා නොමැති සහ ප්‍රමාදවී ලැබෙන අයැදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වුවත් තම අයැදුම්පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් නියමිත දිනට පෙර එවිය යුතුය. මෙම තනතුර සඳහා වෘත්තීය පරීක්ෂණය පමණක් පවත්වනු ලබන අතර, ලිඛිත විභාගයක් පවත්වනු නොලැබේ.

03. තනතුරේ රාජකාරී ස්වභාවය ：

අධීක්ෂණ කළමනාකරු (සංඥා හා විදුලි සංදේශ)

දුම්රිය ධාවනයට උචිත වන අන්දමින් දුම්රිය සංඥා පද්ධතිය හා විදුලි සංදේශ ක්‍රම අළුතින් ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා පවත්වාගෙන යාමේදී අධීක්ෂණ කළමනාකරුවෙකුගේ කාර්යභාරය ඉටු කිරීම.

04. වැටුප් පරිමාණය ： රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව,

(i) රු. 34,130 - 5 x 495 - 5 x 575 - 10 x 720 - 10 x 745 - රු. 54,130ක් වන අතර, රු. 23,552 ක ආරම්භක වැටුප් තලයේ තබා ගෙවීම් කරනු ලැබේ.

(ii) මීට අමතරව රාජ්‍ය සේවකයින් සඳහා මූලික වැටුපට අමතරව ගෙවනු ලබන අනෙකුත් දීමනා සඳහාද හිමිකම් ඇත.

(iii) අසනීපවී රෝහල් ගතවීමට සිදුවන අවස්ථාවලදී ''අග්‍රහාර'' රක්ෂණ ආවරණය යටතේ වැයවූ මුදල ප්‍රතිපූරණය කර ගැනීමට හැකිය.

(iv) සේවා අවශ්‍යතාව අනුව නිල නිවාස ලබා ගැනීමට හිමිකම් පවතී.

05. (*අ*) අධ්‍යාපන සුදුසුකම් ：

(i) (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම;

*සහ*

(ii) ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ ගණිත විෂයධාරාවන්ට අයත් විෂයන් තුන (03) කින් අ. පො. ස. (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම.

(*ආ*) වෘත්තීය සුදුසුකම් ：
ඉහත (අ) i හා ii හි මූලික අධ්‍යාපන සුදුසුකම් සහිතව පහත සඳහන් වෘත්තීය සුදුසුකම් වලින් එකක් අයැදුම්කරුවන් විසින් ලබා තිබිය යුතුය.

(i) මොරටුව විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව

හෝ

(iii) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පිරිනමනු ලබන උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව

හෝ

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

හෝ

(v) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා වෘත්තීය කුසලතා (NVQ) හය (06) මට්ටමේ තනතුරට අදාල ක්ෂේත්‍රයක පාඨමාලාවක්

(විදුලි හා ඉලෙක්ට්‍රොනික් විෂය කේෂ්ත්‍රය යටතේ අදාල සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.)

(*ඇ*) වෙනත් සුදුසුකම් :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) අයැදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින්ද යුක්ත විය යුතුය.
(iii) අයැදුම් කිරීම සඳහා සුදුසුකම් ලබනුයේ පිරිමි අයැදුම්කරුවන් පමණි.

*සටහන* : මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට ඉහත සඳහන් සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

06. බඳවා ගැනීමේ ක්‍රමය :

ඉහත (05) හි දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයැදුම්කරුවන් සඳහා වෘත්තීය පරීක්ෂණයක් පවත්වා ලබා ගන්නා ලකුණු අනුපිළිවෙළ මත බඳවා ගනු ලැබේ. අයැදුම්පත් කැඳවනු ලබන අවස්ථාවේ පැවති පුරප්පාඩු පමණක් පුරවනු ලැබේ.

07. තේරීම් පරිපාටිය :
වෘත්තීය පරීක්ෂණයෙන් ලකුණු 50%ක් බැගින් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයැදුම්කරුවන් පරීක්ෂණය සමත්වූ අය සේ සලකනු ලැබේ. ලකුණු ලබාගත් අනුපිළිවෙල මත පෙලගස්වා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් මූලික සුදුසුකම් සපුරා ඇති අය අතරින් තෝරාගනු ලැබේ.

1. ලකුණු ලබාදීමේ පටිපාටිය - මුළු ලකුණු 100

වෘත්තීය පරීක්ෂණය කොටස් දෙකකින් යුක්ත වේ.

01. සම්මුඛ පරීක්ෂණය

පහත විෂය නිර්දේශය පදනම් කරගනිමින් අපේක්ෂකයන්ගේ දැනුම හා සංඥ හා විදුලි සංදේශ උප දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා වන ඇල්ම - කැමැත්ත හා රාජ්‍ය සේවයේ රැඳී සිටීමට දක්වන කැමැත්ත පරීක්ෂා කෙරේ.

(ලබාදෙන ලකුණු සංඛ්‍යාව 40 කි.)

(*අ*) විදුලි ඉංජිනේරු විෂයය (Electrical Engineering)
එකලා හා තෙකලා විදුලිය (Single Phase and Three Phase) පිළිබඳ මූලික දැනුම - විදුලිය සම්ප්‍රේශණය - ප්‍රත්‍යාවර්ථ ධාරා - සරල ධාරා (Alternting current - Direct current) බවට පත්කරන උපකරණය විදුලි මෝටර් පිළිබඳ සිද්ධාන්ත Transformer සහ සරළ ධාරා පරිපථවල දෝෂ හඳුනා ගැනීම පිළිබඳ දැනුම

(*ආ*) විද්‍යුත් ඉංජිනේරු විෂයය (Electronic Engineering)
විද්‍යුත් ඉංජිනේරු උපාංග (Diode Transistor SCR) සහ විවිධ වර්ගයේ වර්ධක (Amplifiers) පිළිබඳ දැනුම
සංඛ්‍යාංක විද්‍යුත් ඉංජිනේරු උපාංග (Digital Electronic) (Logic Gates Digital IC) පිළිබඳ දැනුම
Digital Etectronic පරිපථවල දෝෂ හඳුනා ගැනීම සහ එම පරිපථ සැළසුම් කිරීම පිළිබඳ දැනුම

(*ඇ*) විද්‍යුත් සංනිවේදන ඉංජිනේරු විෂයය (Electronic Communication Engineering)
ගුවන් විදුලි තරංග - ගුවන් විදුලි තරංග සම්ප්‍රේශණය (Radio Transmission)

සහ

ගුවන් විදුලි උපකරණ (Radio Transmitters and Receives) ගැන දැනුම
පරිඝණක පද්ධති (Computer Networks) සහ පරිඝණක සන්නිවේදනය (Computer Communication) පද්ධති මෘදුකාංග, ආදිය පිළිබඳ දැනුම

02. ප්‍රායෝගික පරීක්ෂණය

ඉහත විෂයයන් 03 පදනම් කරගත් ප්‍රායෝගික පරික්ෂණ තුනකට අයදුම්කරුවන් යොමුකොට එම විෂයයන් පිළිබඳ ප්‍රායෝගික දැනුම මැන බැලීම සිදු කෙරේ. මෙහිදී උපකරණ හඳුනා ගැනීම හා දෝෂ හඳුනා ගැනීම සඳහා උපකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කර බැලීම ද සිදු කෙරේ. (ලබාදෙන ලකුණු සංඛ්‍යාව 60කි.)

08. අයදුම්පත් සකස් කිරීමට හා සම්පූර්ණ කිරීමට උපදෙස් :

(i) අයදුම්පත A 4 (යතුරු ලියන කඩදාසි) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙළ කළ යුතුය.
(අයදුම්පත තම අත් අකුරින් සම්පූර්ණකළ යුතුයි.)
අයදුම්පතේ -
1 වැනි පිටුවේ 01 සිට 08 තෙක් කරුණු ද
2 වැනි පිටුවේ 09 සිට 12 තෙක් කරුණු ද
3 වැනි පිටුවේ අත්සන සහතික කිරීම හා දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකයද ඇතුළත් විය යුතුය.

ආදර්ශ අයැදුම්පතට අනුකූල නොවන ඉල්ලුම් පත් සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු

ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන අයැදුම් පත්‍රය නිවේදනයේ සඳහන් ආදර්ශ අයැදුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයැදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. අයදුම්පත පිළියෙල කර ගන්නා විට ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයැදුම් පත්‍ර වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයැදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.

(ii) අදාල වෘත්තීය පරීක්ෂණය සඳහා ගාස්තුව රු. 500කි. එය මහජන බැංකුවේ නගර මධ්‍ය ශාඛාවේ දුම්රිය සාමාන්‍යාධිකාරීගේ ගිණුම අංක 176-1001-29027-313 ට බැර කර අදාල ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇමිණිය යුතුය. මෙම ලදුපතෙහි ඡායා පිටපත් ඉදිරිපත් කිරීම හෝ වෙනයම් ආකාරයට මුදල් ගෙවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ. තව ද පරීක්ෂණ ගාස්තු ගෙවා ලබාගත් ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. වෘත්තීය පරීක්ෂණය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් නොකරනු ලැබේ. තවද වෘත්තීය පරීක්ෂණයේ ගාස්තු සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

(iii) අයැදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ ''ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය අධීක්ෂණ කළමණාකරණ සේවයේ - සංඥ හා විදුලි සංදේශ III තනතුරු සඳහා විවෘත බඳවා ගැනීම - 2017'' යන්න සඳහන් කරන්න.

(iv) බාහිර අයැදුම්කරුවන්ගේ අයැදුම්පත් වල අත්සන සහතික කිරීම.

අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් මෙම වෘත්තීය පරීක්ෂණයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතීඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු, රු. 2,40,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

(v) දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු පුද්ගලයන්ගේ අත්සන් තම ආසන්නතම සේවා ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. මොවුන්ගේ අයැදුම්පත් අදළ ආයතන ප්‍රධානීන් මගින් එවීම අනිවාර්ය වේ.

(vi) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත වෘත්තීය පරීක්ෂණ ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත ඉදිරිපත්කර පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීමද අදළ නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකයද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත පරීක්ෂණය සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

09. සේවා කොන්දේසි :

බඳවා ගනු ලබන්නේ දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවයේ අධීක්ෂණ කළමනාකරු (සංඥ හා විදුලි සංදේශ) III වැනි ශ්‍රේණියට වන අතර, නියමිත වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවරේ තබනු ලැබේ.

10. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හි විධිවිධාන අනුව රාජ්‍ය සේවයට බැඳුනු භාෂා මාධ්‍යයට අමතරව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවක් වසර 05ක් තුළ ලබා ගත යුතුය. එම ප්‍රවීණතාව ලබා නොගන්නා නිළධාරීන්ගේ වැටුප් වර්ධක සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ලැබේ.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයින් ආයතන සංග්‍රහයේ සහ මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන වලටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ඇති ආයතන කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ විධිවිධාන වලටත් යටත්ව කටයුතු කළ යුතුය. එමෙන්ම විටින් විට රජය විසින් නිකුත් කරන නියෝග දෙපාර්තමේන්තු උපදෙස් වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටී.

11. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කරුණක් පිළිබඳව අවසාන තීරණය ගැනීමේ බලය දුම්රිය සාමාන්‍යාධිකාරී සතු වේ.

12. මෙම නිවේදනයේ සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය නිවේදන අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇත්තේ නම් එවැනි විටකද සිංහල මාධ්‍යයෙන් වන නිවේදනය නිවැරදි බව සලකා කටයුතු කළ යුතුය.

බී. ඒ. පී. ආරියරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

(මේ අනුව A-4 කඩදසි වල දෙපසම භාවිතා කරමින් පිළියෙල කරගත් අයැදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයැදුම්පත් කැඳවීමේ නිවේදනය කියවා හොඳින් වටහා ගත යුතුය.)

ආදර්ශ අයදුම්පත්‍රය

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව**

දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය අධීක්ෂණ කළමණාකරණ සේවයේ අධීක්ෂණ කළමනාකරු (සංඥා හා විදුලි සංදේශ) III වැනි ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම (බාහිර) - 2017
External Recruitment For The Post In Railway Supervisory Management
(Signal & Telecommunication) Service Grade III - 2017

01. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :

(i) සිංහලෙන්/දෙමළෙන් : ———— .
(ii) ඉංග්‍රීසියෙන් : ———— .
(උදා : PERERA, R.M.D.C.P.A. )

02. මුල්'කුරු වලින් හැඳින්වෙන නම් :

(i) සිංහලෙන්/දෙමළෙන් : ———— .
(ii) ඉංග්‍රීසියෙන් : ———— .

03. ස්ථිර ලිපිනය :

(i) සිංහලෙන්/දෙමළෙන් : ———— .
(ii) ඉංග්‍රීසියෙන් : ———— .

04. ස්ත්‍රී/පුරුෂ භාවය :
ස්ත්‍රී 1
පුරුෂ 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. ජන වර්ගය :
සිංහල - 1 / ශ්‍රී ලංකා ද්‍රවිඩ - 2 / ඉන්දියා ද්‍රවිඩ - 3
මුස්ලිම් - 4/ බර්ගර් - 5 /මැලේ - 6
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. පදිංචිය :

(i) ග්‍රාම නිළධාරි කොට්ඨාසය : ———— . එහි අංකය :

(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: ———— .

(iii) දිස්ත්‍රික්කය: ———— .

08. උපන්දිනය : වර්ෂය මාසය දිනය

09. දුරකථන අංකය :

10. 2017.04.17 දිනට වයස : අවු මාස දින

11. අධ්‍යාපන සුදුසුකම් :

(i) අ. පො. ස. (සා.පෙළ)
විභාග අංකය : ————— . වර්ෂය : ————— .

| අනු අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| i | | |
| ii | | |
| iii | | |
| iv | | |
| v | | |
| vi | | |
| vii | | |
| viii | | |
| ix | | |

(ii) අ. පො. ස. (උසස් පෙළ)

විභාග අංකය : ————— . වර්ෂය : ————— .

| අනු අංකය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| i | | |
| ii | | |
| iii | | |
| iv | | |

(iii) වෘත්තීය සුදුසුකම් :

.....................................................................................................................
.....................................................................................................................
.....................................................................................................................

12. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?
(අදාළ කොටුව තුළ " X " ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

13. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සහ/ හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගු වන බව හොඳින් දැන සිටිමි. ඉන් වන හානිය මම පුද්ගලිකව දරා ගනිමි.

(ආ) ඉහත (අ) හි දක්වා ඇති කරුණු අසත්‍ය බව මා තනතුරට පත්වීමෙන් පසුව හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් බව ද ප්‍රකාශ කරමි. ඉන් සිදුවන හානි වෙතොත් ඒවා ද මම පුද්ගලිකය දරා ගනිමි.

(ඈ)............................ දින මහජන බැංකුවේ ....................................... බැංකු ශාඛාවට රු. 500 ක් ගෙවා ලබා ගත් ලදුපත මේ සමඟ අමුණා ඇත.

| ලදුපත නොගැලවෙන සේ එහි එක් දරයකින් මෙහි අලවන්න.<br>(ලදුපතෙහි ඡායා පිටපතක් ලඟ තබාගන්න) |
|---|

(ඇ)මෙම පරීක්ෂණයේ කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.

(ඉ) තවද පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන

දිනය : ————— .

14. අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත ඉදිරිපත් කරන ....................... මහතා මම පුද්ගලිකව හඳුනමි. ඔහු .......................... දින ඉහත අත්සන මා ඉදිරිපිට දී තැබූ බවද නියමිත පරීක්ෂණ ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

—————,
සහතික කරන අයගේ අත්සන

දිනය : ————— .
සහතික කරන අයගේ සම්පූර්ණ නම : ————— .
තනතුර : ————— .
ලිපිනය : ————— .
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

15. දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය :
මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති .................................. මහතා ......................................... දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ............................ දින සිට ................ දින දක්වා .......................................... වශයෙන් සේවය කර ඇත. ඔහුට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී නැත/ඇත. ඔහුගේ වැඩ,හැසිරීම හා පැමිණීම සතුටුදයකය/අසතුටුදයකය. නියමිත පරීක්ෂණ ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ඔහු දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමණාකරු ''සංඥා හා විදුලි සංදේශ'' 111 තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ආයතනයෙන් මුද හැරීමට හැකි/නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

—————,
දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය : ————— .
සහතික කරන අයගේ සම්පූර්ණ නම : ————— .
තනතුර : ————— .
ලිපිනය : ————— .
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

03-547

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.